# 6 වන දවස

## ස්වර්ගයේ වැඩ සිටින අපගේ පියාණෙනි

දෙවියන් වහන්සේ කෙරෙහි පූර්ණව අපට විශ්වාසය තැබිය හැක. ඔවුන් වහන්සේ පොරොන්දු ඉටු කරන තැනැන්වහන්සේ ය. ඔවුන් වහන්සේගේ වචන ඵල දරන්නේ ම ය. "**............ මා මුවින් නික්මෙන වචන මා වෙතට හිස්ව නොපැමිණ මාගේ අදහස් සඵල කර නියමයන් සිකුරටම ඉටු කරයි**" (යෙසායා 55:10-11). සිතන පතන සෑම දෙයක් ම සඵල කරගත හැකි කිසිවෙක් මෙලොව නැත. සෑම පොරොන්දුවක් ම ඒ ලෙසින් ම ඉටු කළහැකි අය ද නැත. ආශාව තිබුණත් සීමාවන් නිසා ඉටු කරගන්නට සමහරුනට බැරි ය. තවත් අය කෙනෙකුව තාවකාලිකව සතුටු කිරීමට බොරු පොරොන්දු දෙයි. එහෙත් දෙවියන් වහන්සේට සියල්ල කළහැකි ය. ඔවුන් වහන්සේගේ වචනය සීමා රහිතව ම බලගතු ය. ඔවුන් වහන්සේ පොරොන්දුවක් දුන්නොත් නැතහොත් වචනයක් දුන්නොත් එය එසේ ම ඉටු වන්නේ ය. එමනිසා අපගේ ආදර තාත්තා කෙරෙහි පූර්ණව අපට විශ්වාසය තැබිය හැකි ය. අපි අපගේ අබ්බා තාත්තා කෙරෙහි පූර්ණ විශ්වාසය තබමු.

**දවස පුරා :-**

- ✵ මේ දිනවල ඔබ දේව වචනයක් අයිති කරගෙන සිටිනවා ද? නැතිනම් දිව්‍ය පූජා වෙලාවේ දී ප්‍රකාශ කරන වචනයක් අයිති කරගන්න. එය ප්‍රකාශයක් හෝ පොරොන්දුවක් විය හැක. එම වචනය අයිති කර ගැනීමට විශ්වාසය ඉල්ලා යදින්න.
- ✵ පුබුදු ගීතාංජලී ගී අංක 54